සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

44 S I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය :................................ නර්තනය - I** කාලය: පැය 03 යි.

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(1) උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන්හි මූලික අංගහාර හඳුනා ගැනීම සඳහා ආධුනිකයෙකු ප්‍රථමයෙන්ම ............. අභ්‍යාස කරනු ලැබේ.
1. ගොඩ සරඹ හා වන්නම්
2. ගොඩ සරඹ හා ඉලංගම් සරඹ
3. පා සරඹ හා දොඹින පද
4. මංගලම් හා වට්ටම් පද

(2) අදහස් ප්‍රකාශනය සඳහා බාහිරින් යොදා ගනු ලබන දෑ අයත් වන්නේ ................ ටය.
1. ආහාර්ය අභිනය
2. වාචික අභිනය
3. සාත්වික අභිනය
4. ආංගික අභිනය

(3) මාත්‍රා $2+4$ තාල රූපය යනු ......... වේ.
1. සුළු මහ දෙතිත
2. සුළු මැදුම් දෙතිත
3. මැදුම් මහ දෙතිත
4. දෙසුළු මහ තුන්තිත

(4) ආඝාතය දැක්වීම සඳහා යොදා ගනු ලබන තාලම්පට................. වාද්‍යය භාණ්ඩයකි.
1. ඝණ 2. සුසිර 3. ආතත 4. විතත

(5) ................... යනු අවකාශ භාවිතයේ දී හමුවන මූල ධර්ම දෙකකි.
1. අක්ෂර සහ මාත්‍රා
2. රස හා භාව
3. තල සහ දිසා
4. තාලය හා රිද්මය

(6) මුරුගන් දෙවියන්ට පූජෝපහාර පිණිස කරනු ලබන ද්‍රවිඩ ගැමි නැටුම ...................... වේ.
1. කෝලාට්ටම්
2. කාවඩි
3. පින්නල් කෝලාට්ටම්
4. සුලකු

(7) 'ශාන්ත' නම් ස්ථායි භාවයෙන් ................... රසය උපදිනු ලබයි.
1. හාස්‍යය 2. බීභත්ස්‍ය 3. ශාන්ත 4. ශෘංගාර

(8) දළදා සිරිත සහ උම්මග්ග ජාතකය යන කෘතිවලින් .............. යුගයේ නර්තන කලාව පිළිබඳ මූලාශ්‍ර සපයයි.
1. කුරුණෑගල
2. මහනුවර
3. අනුරාධපුර
4. දඹදෙණි

(9) වන්නම් රචනා වීම පිළිබඳව විවිධ මත ................... මහතාගේ නෘත්‍ය රත්නාකරය නැමැති කෘතියේ සඳහන් වේ.
1. මුදියන්සේ දිසානායක
2. තිස්ස කාරියවසම්
3. ජේ. ඊ. සේදරමන්
4. ජයසේන කෝට්ටේගොඩ

(10) වන්නම් 18 ට අමතරව නිර්මාණය වූ වන්නම් ලෙස ........................... වන්නම් සඳහන් කළ හැකිය.

1. මරඟන, හංස
2. හංස, ආනන්ද
3. සමනල, කොවුලා
4. නළු ගීතිකා, මහබෝ

(11) හඬ සුසර කර ගැනීම සඳහා කිතුල් තතක් බඳිනු ලබන්නේ,

1. දවුලට ය.
2. උඩැක්කියට ය.
3. ගැටබෙරයට ය.
4. බුම්මැඩියට ය.

(12) 'මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්' යනුවෙන් තම කෘතියෙහි සඳහන් කොට ඇති දේශාටන වාර්තාකරු වන්නේ,

1. ස්පිල් බර්ජන් ය.
2. ඉබන් බතූතා ය.
3. රොබට් නොක්ස් ය.
4. වීදාගම මෛත්‍රී හිමි ය.

(13) ස්ථාවර වෙස් මුහුණු පැළඳ නැටීම සුවිශේෂ ලක්ෂණයක් ලෙස දැකිය හැක්කේ.......

1. සොකරි නාට්‍යයේ ය.
2. ගීත නාට්‍යයේ ය.
3. ශාන්ති කර්මවල ය.
4. කෝලම් නාට්‍යයේ ය.

(14) විනෝදාස්වාදය සහ සශ්‍රීකත්වය මුල්කොට පවත්වන ලද සොකරි රඟ මඬල,

1. ඍජුකෝණාස්‍රාකාර ය.
2. හතරැස් ය.
3. කවාකාර ය.
4. අර්ධ කවාකාර ය.

(15) බලි ශාන්ති කර්මයට පමණක් සුවිශේෂී ලක්ෂණයක් නොවන්නේ,

1. නාට්‍යමය පෙළපාලිවලින් යුක්ත වීම.
2. අත්මිණිය සුවිශේෂීව භාවිත කිරීම
3. නව ග්‍රහයින් මුල්කොට පැවැත්වීම.
4. ආසාතාත්මක සහ අනාසාතාත්මක ගායන යොදා ගැනීම.

(16) ප්‍රේම කුමාර එපිටවෙල සහ චිත්‍රසේන ශූරීන් විසින් නිෂ්පාදිත මුද්‍රා නාට්‍යය දෙකකි.

1. සැළලිහිණි සහ කරදිය
2. ග්‍රහ අපලය සහ පරවිය
3. කරදිය සහ දෙපානෝ
4. නල දමයන්ති සහ රන්දද

(17) ප්‍රස්තාරකරණයේ දී ඇදෙන මාත්‍රා හඳුන්වනු ලබන්නේ,

1. ලඝු නමිනි
2. ප්ලූත නමිනි
3. ගුරු නමිනි
4. දෘත නමිනි.

(18) දක්ෂිණ භාරතීය කථකලි නර්තනයේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය සහ සුසිර වාද්‍ය භාණ්ඩය මෙසේ හැඳින්වේ.

1. චෙන්ඩාව සහ කුම්බු
2. මෘදංගය සහ නාගස්වරම්
3. මද්දලය සහ කොම්බුව
4. එඩක්ක සහ නාගසින්නම්

(19) භාරත නාට්‍යම් සංදර්ශනයක දැකිය හැකි නර්තනාංග,

1. ජතිස්වරම්, පදම්, මේලප්පදම්
2. පදම්, ශබ්දම්, අෂ්ඨකලාසම්
3. වර්ණම්, තිල්ලානා, ශබ්දම්
4. මේලප්පදම්, පදම්, ශබ්දම්

(20) ''අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී'' යනු,

1. නොංචි අක්කා වර්ණනා කරන කවියකි.
2. ලෙංචිනා වර්ණනා කරන කවියකි
3. සොකරි වර්ණනා කරන කවියකි
4. පුරංසිනා වර්ණනා කරන කවියකි.

NWP EXAM

* 21 සිට 24 දක්වා ප්‍රශ්නවලට රූපාවලී ඇසුරෙන් පිළිතුරු සපයන්න.



A



B



C

(21) A හා C පින්තූර වලින් නිරූපනය වන්නේ,
1. පණිභාරත සහ රොබට් නොක්ස් 
2. රොබට් නොක්ස් සහ චිත්‍රසේන මහතා
3. පණිභාරත සහ චිත්‍රසේන මහතා 
4. පණිභාරත සහ රවීන්ද්‍රනාත් තාගෝර්තුමා

(22) B අක්ෂරයෙන් නිරූපණය වන්නේ,
1. මිරන්ඩා හේමලතා මහත්මිය 
2. වජිරා චිත්‍රසේන මහත්මිය
3. අංජලිකා චිත්‍රසේන මහත්මිය 
4. චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය

(23) ශාප්මෝචන් නැමති මුද්‍රා නාට්‍ය නිර්මාපකයාගේ ඡායාරූපයට අදාළ අක්ෂරය වන්නේ,
1. A ය. 
2. B ය. 
3. C ය. 
4. A හා C ය.

(24) ග්‍රහ අපලය, දිව්‍ය මංගලිකා යන මුද්‍රා නාට්‍ය නිර්මාණකරුවාට අදාළ අක්ෂරය වන්නේ,
1. A අක්ෂරය 
2. B අක්ෂරය 
3. C අක්ෂරය 
4. A සහ B අක්ෂර

(25) කථකලි නර්තනයේ ගීත ගායනා කරනු ලබන්නේ,
1. හින්දි හා දෙමළ බසිනි 
2. දෙමළ හා සංස්කෘත බසිනි.
3. සංස්කෘත හා මලයාලම් බසිනි 
4. මලයාලම් හා හින්දි බසිනි.

(26) කොහොඹා කංකාරි ශාන්ති කර්මයට ආවේණික වූ චාරිත්‍ර දෙකකි.
1. හඟල යෑදීම සහ මිල්ල කැපීම 
2. වැදි යක්කම සහ මිල්ල කැපීම
3. හඟල යෑදීම සහ අයිලේ යෑදීම 
4. කප් සිටුවීම සහ මිල්ල කැපීම

(27) දෙවොල් මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළපාලි ලෙස,
1. රාමා මැරීම සහ පොත්කඩේ පාලිය 
2. ඇත් බන්ධන සහ මී බන්ධනය
3. අඹ විදමන සහ අසුර යක්කම 
4. ගබඩා කොල්ලය සහ මී බන්ධනය

(28) පබළු ඇඳුම් කට්ටලය සහ මල් පද ඇඳුම් කට්ටලය දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදාය වන්නේ,
1. සබරගමු සම්ප්‍රදාය 
2. උඩරට සම්ප්‍රදාය
3. පහතරට සම්ප්‍රදාය 
4. පහතරට හා සබරගමු සම්ප්‍රදාය

(29) පහතරට බෙරය සහ හොරණෑව යොදා ගනු ලබන ප්‍රධාන ගැමි නාට්‍යයකි.
1. සොකරි නාට්‍ය 
2. නාඩගම් නාට්‍ය 
3. මුද්‍රා නාට්‍ය 
4. කෝළම් නාට්‍ය

(30) පූජාර්ථයෙන් පමණක් මූලික අරමුණු කොටගත් වන්නම් විශේෂයකි.
1. සබරගමු වන්නම් 
2. උඩරට වන්නම්
3. පහතරට වන්නම් 
4. නව නිර්මාණ වන්නම්

NWP EXAM

(31) ''තෙයියත් /// තාම්, තේයි තාම් - තෙයි තෙයි තත් තත් තාම්'' මෙය

1. අඩව්වකි 2. කස්තිරමකි 3. සීරුමාරුවකි 4. හමාරපදයකි

(32) කොහොඹා කංකාරියට අයත් චාරිත්‍ර විධි දෙකකි.

1. කප් සිටුවීම හා තොටපේ කිරීම 2. ගුරුගේ මාලාව හා තොටපේ කිරීම
2. මඩුපේ කිරීම හා යක් ඇණුම 4. යක් ඇණුම හා කප් සිටුවීම

(33) ''පහතරට සිංදු වන්නම් 32 ක් ද උඩරට වන්නම් 18 ද ඇත. විෂ්ණු දේවාලයේ ගැයුණු සබරගමු වන්නම් මෙන්ම කවිකාර මඩුවේ නිර්මාණය වූ අනිලා වන්නම ද නර්තනය සඳහා යොදාගෙන ඇත.'' ඉහත ප්‍රකාශය දෙස බලන කළ,

1. එය සම්පූර්ණයෙන් ම නිවැරදි ප්‍රකාශ වේ.
2. එය සම්පූර්ණයෙන් ම වැරදි ප්‍රකාශ වේ.
3. මුල් ප්‍රකාශය නිවැරදි වන අතර පසු ප්‍රකාශය වැරදි ය.
4. පසු ප්‍රකාශයේ ඇතැම් කරුණු ද මුල් ප්‍රකාශය ද නිවැරදි ය.

(34) මාත්‍රා $2 + 3$ තාල රූපයට නර්තනය කළ හැකි වට්ටමකි.

1. කුදකුජිගත වට්ටම 2. දොංජිංත ගත දොංත වට්ටම
3. කුදාංත ගත දොම් වට්ටම 4. ගොග් ගොග් ජිං ජිංගත වට්ටම

(35) ගැටබෙරයෙහි භාවිතා කරන වරපටෙහි දිග වනුයේ,

1. සත් බඹ තුන් වියතකි. 2. සත් බඹ එක් වියතකි
3. සත් බඹ සත් වියතකි 4. සත් බඹ අට වියතකි

(36) ''ජෙං තත් තත් /// ජෙංතා''

1. තුරඟා වන්නමේ කස්තිරම ය. 2. සැවුලා වන්නමේ අඩව්ව ය.
3. සැවුලා වන්නමේ කස්තිරම ය 4. තුරඟා වන්නමේ අඩව්ව ය.

(37) උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ දෙවුර හා පපුවට පළඳිනු ලබන ආභරණ වන්නේ,

1. කෙමෙත්ත හා අවුල්හැර ය. 2. නෙත්ති මාලය හා උරබාහු ය.
3. උරබාහු හා අවුල්හැරය ය. 4. බන්දි වලලු හා අවුල්හැරය ය.

(38) තුරඟා වන්නමේ දෙවැනි කවියේ කවි පාදය ආරම්භ වන්නේ,

1. සත් වෙත් මහත් අදර ......... 2. ගත් ගත් පයත් අසුගෙ ....
3. ලත් ලත් සිතත් තිදෙන..... 4. වෙත් වෙත් එකත් පසුව....

(39) කොහොඹා කංකාරියේ පුද ලබන එක් කොට්ඨාශයකි

1. සන්නි යකුන් හා ගරා යකුන් 2. මෙලෙයි යකුන් හා සන්නි යකුන්
3. රුප්පා යකුන් හා කළු යකුන් 4. මෙලෙයි යකුන් හා රුප්පා යකුන්

(40) ගොයම් නර්තනය හා මෝල්ගස් නර්තනය නිර්මාණය කර වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වන්නේ,

1. පණීභාරත මහතාට හා වජිරා චිත්‍රසේන මහත්මියට ය.
2. චිත්‍රසේන මහතාට හා මිරැන්ඩා හේමලතා මහත්මියටය.
3. පණීභාරත මහතාට හා මිරැන්ඩා හේමලතා මහත්මියට ය
4. මිරැන්ඩා හේමලතා මහත්මියට හා වජිරා චිත්‍රසේන මහත්මියට ය.

NWPEXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

44 | S | II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය :................................ නර්තනය - II

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

- හිස්තැන් පුරවන්න.

(1) (i) ........................................................ රජුගේ සමයේදී ගිරිබණ්ඩ නම් පූජාවක් කළ බවද එහිදී රනින් කළ බෙර අටක් වැයීමට රජු අණ කළ බව මහා වංශයේ සඳහන් වේ.

(ii) ත්‍රිවිධ රත්නය කෙරෙහි භක්ති පූර්වක ව ගැයෙන ගායනා විශේෂයකි..........................................................

(iii) සොකරි හා අඬියාගුරුගේ අතවැසියා ලෙස ..................................... හැඳින්වේ.

(iv) 'කුඹී කථාව' නම් මුද්‍රා නාට්‍යයේ රංග රචනය කරන ලද්දේ ..................................... විසිනි.

(v) දළදා පෙරහැර පවත්වා අවසානයේ වස්දොස් දුරු කිරීම සඳහා විෂ්ණු දේවාලයේ පවත්වනු ලබන ශාන්ති කර්මය ............................................. වේ.

(vi) සබරගමු සම්ප්‍රදායේ මණ්ඩුක වන්නමෙන් කියැවෙන්නේ ............................ පිළිබඳ විස්තරයකි.

(vii) ගබඩා කොල්ලය කොහොඹා කංකාරියේ එන ..................................... අවස්ථාවකි.

(viii) 1930 ආරම්භ කළ කථකලි නර්තනය උගන්වනු ලබන ආයතනය ....................................... වේ.

(ix) මල්මඩුපුරය නම් නර්තන අංගය දැකිය හැකි නර්තන සම්ප්‍රදාය වන ශාන්තිකර්මය,

i. සම්ප්‍රදාය:- ..............................................................

ii. ශාන්තිකර්මය:- ..............................................................

(x) 'ගුංද දෙගත ගතිගතගුඳ යන බෙරපදය වාදනය කිරීමට සුදුසුම බෙරය හා එහි තාල රූපය වන්නේ,

i. බෙරය :- ..................................................................

ii. තාලරූපය :- ..................................................................

(2) (i) සුළු මැදුම් දෙතිත (2 + 3) අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) ''අතකට ගෙන රබන් පොඩිය වයති දිසි රැවින්''.. යන කවි පාදය මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

(3) පහත මාතෘකා අතුරෙන් 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ටීකා සී පද

(ii) බිසෝ කප සිටුවීම

(iii) රසභාව සංකල්පය

(iv) වෙස් මෝස්තර නිර්මාණ

(4) ශාන්ති කර්ම පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් නර්තන කලාව පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ඉගෙන ගැනීමට හැකියාව ඇත.

(i) දෙවොල්මඩු ශාන්තිකර්මයේ උපත් කථාව කෙටියෙන් ලියන්න.

(ii) පහන් මඩුවේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.

(iii) කොහොඹා කංකාරියේ ගායනය සහිත නර්තනාංගයක් විස්තර කරන්න.

(5) දේශීය ජන නාටක අතර සොකරි සහ කෝළම් නාට්‍ය විශේෂ වේ.

(i) සොකරි හෝ කෝළම් නාට්‍යයට අයත් කවියක් ලියා දක්වන්න.

(ii) කෝළම් නාට්‍යයේ මානුෂ චරිත දෙකක් සහ අති මානුෂ චරිත දෙකක් නම් කරන්න.

(iii) සොකරි සහ කෝළම් නාට්‍ය වලට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ පිළිබඳ විස්තර කරන්න.

(6) (i) අනුරාධපුර සහ පොළොන්නරු යුගවල නර්තනයට භාරතීය ආභාෂය ලබා ඇති ආකාරය පිළිබඳ විස්තර කරන්න.

(ii) නර්තනය පිළිබඳ ලිය වී ඇති දේශාටන වාර්තා දෙකක් ඉදිරිපත් කරන්න.

(iii) කුරුණෑගල යුගයේ නර්තනය තිබූ බව එක් මූලාශ්‍රයක් මගින් පැහැදිලි කරන්න.

(7) (i) භාරතීය නර්තන සම්ප්‍රදායන් 4 නම් කරන්න.

(ii) භරත නාට්‍යම් සම්ප්‍රදායේ නර්තන අංග 7 පිළිවෙලින් නම් කරන්න.

(iii) නූතන ප්‍රාසාංගික රූපවාහිනී නර්තන කලාව පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

### නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

| ප්‍රශ්න අංකය | ප්‍රශ්න | ලකුණු |
|---|---|---|
| 01. | ක්‍රියාකාරකම - ගායනය හා වාදනය | |
| | (i) කැමති ගායනයක් කරන්න. | 05 |
| | (ii) මෝල්ගස් හෝ හටන් කවියක් ගායනය කරන්න. | 05 |
| | (iii) කැමති බෙර සරඹයක් ලය තුනට වාදනය කරන්න. | 05 |
| | (iv) තනි තිතේ ප්‍රභේදයට අනුව නම් කරන ලද බෙර පදයක් වාදනය | 05 |
| 02. | ක්‍රියාකාරකම - සරඹ හා වට්ටම් නැටීම | |
| | (i) 5, 6, 7, 8, 9 ගොඩ සරඹ වලින් නම් කරන ලද සරඹය නැටීම | 05 |
| | (ii) එම සරඹයේ කස්තිරම නැටීම | 05 |
| | (iii) දොං ජිංත ගත දොංත වට්ටමේ පළමු පදය හෝ දෙවන පදය නටා කස්තිරම, අඩව්ව නර්තනය කිරීම | 10 |
| 03. | ක්‍රියාකාරකම - වන්නම් නැටීම | |
| | (i) වෛරොඩි, තුරඟා, සිංහරාජ, සැව්ලා, වන්නම්වලින් එකක් සම්පූර්ණයෙන් නැටීම. | 20 |
| 04. | ක්‍රියාකාරකම - ගැමි හා ජීවන වෘත්තීන් හා බැඳි නර්තන | |
| | (i) රබන්/කුලු/ලී/චාමර ගැමි නැටුම්වලින් එකක් නර්තනය කරන්න. | 10 |
| | (ii) ධීවර/මැටි/කෘෂි/තේ/කොහු කර්මාන්තයක් ඇසුරින් නර්තන නිර්මාණයක් කරන්න. | 10 |
| 05. | ක්‍රියාකාරකම - නිර්මාණ කුසලතා | |
| | (i) නාට්‍ය ගීතයට අනුව නර්තන<br>හනික වරෙව් කොල්ලනේ, මෙම ගිම්හාන, රන්වන්දුල් කරලින් පැසිලා... මින් කැමති ගීතයකට අනුව නිර්මාණයක් කරන්න. | 10 |
| | (ii) චරිත සිද්ධි ඇසුරින් නර්තන නිර්මාණ<br>• මල් නෙළන කුමරියක් කකුලේ විෂ කටුවක් ඇනී වේදනා විඳ සිහිමූර්ජා වීම.<br>• කැලයේ දර කඩමින් සිටින කාන්තාවකට නාගයෙකු දෂ්ඨ කිරීම.<br>• මුහුදු ගිය තම පුතු පෙරලා පැමිණෙන තෙක් බලා සිටින මවට, පුතු මුහුදට බිලි වූ බව දැනගන්නට ලැබීම.<br>• ඔබ මොබ ඇවිදිමින් විහිළු කරන ලද රිලවෙකුට කණ්නාඩියක් හසුවීම. | 10 |
| | මුළු ලකුණු | 100 |